# උතුරු මැද පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව

# සී/ස විවිධ සේවා සමුපකාර සමිතිවල පුරප්පාඩු වී ඇති තනතුරු සඳහා බඳවා ගැනීම

උතුරු මැද පළාත තුළ පිහිටා ඇති පහත සඳහන් සී/ස විවිධ සේවා සමුපකාර සමිතිවල පුරප්පාඩු වී ඇති සාමාන්‍යාධිකාරී හා ගණකාධිකාරී තනතුරු සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ඇති උතුරු මැද පළාත තුළ පදිංචි අයදුම්කරුවන්ගෙන් 2024.01.05 දින දක්වා අයදුම්පත්‍ර කැඳවනු ලැබේ.

01. සාමාන්‍යාධිකාරී හා ගණකාධිකාරී තනතුරු පුරප්පාඩු වී ඇති විවිධ සේවා සමුපකාර සමිති.

| අංකය | සමුපකාර සමිතියේ නම | ශ්‍රේණිගත කිරීම | පුරප්පාඩු තනතුරු |
|---|---|---|---|
| 01 | සී/ස උතුරු මැද පළාත් සමුපකාර සංගමය | ඩී ශ්‍රේණිය | සාමාන්‍යාධිකාරී |
| 02 | සී/ස කහටගස්දිගිලිය විවිධ සේවා සමුපකාර සමිතිය | සී ශ්‍රේණිය | සාමාන්‍යාධිකාරී |
| 03 | සී/ස කැකිරාව විවිධ සේවා සමුපකාර සමිතිය | ඩී ශ්‍රේණිය | සාමාන්‍යාධිකාරී |
| 04 | සී/ස හුරුළුවැව විවිධ සේවා සමුපකාර සමිතිය | ඩී ශ්‍රේණිය | ගණකාධිකාරී |
| 05 | සී/ස එප්පාවල විවිධ සේවා සමුපකාර සමිතිය | ඩී ශ්‍රේණිය | ගණකාධිකාරී |
| 06 | සී/ස ගල්නෑව විවිධ සේවා සමුපකාර සමිතිය | ඩී ශ්‍රේණිය | ගණකාධිකාරී |
| 07 | සී/ස ජයන්තිපුර විවිධ සේවා සමුපකාර සමිතිය (පොළොන්නරුව) | ඩී ශ්‍රේණිය | ගණකාධිකාරී |

**02. සාමාන්‍යාධිකාරී තනතුර සඳහා අධ්‍යාපන සුදුසුකම් :**

01. පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් වාණිජවේදී හෝ ව්‍යාපාර කළමනාකරණ උපාධියක් ලබා තිබීම. (රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක කළමනාකරණ මට්ටමේ වසර 02 ක පළපුරුද්ද විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ) හෝ

02. ශ්‍රී ලංකා උසස් තාක්ෂණ ආයතනයේ ව්‍යාපාර අධ්‍යයනය උසස් ඩිප්ලෝමාව ලබා තිබීම.

**03. සාමාන්‍යාධිකාරී තනතුරේ වැටුප් පරිමාණයන් :**

| ඒ ශ්‍රේණිය | බී ශ්‍රේණිය | සී ශ්‍රේණිය | ඩී ශ්‍රේණිය |
|---|---|---|---|
| 40850X47750 | 35850-42750 | 30850-37750 | 25850-32750 |
| 8X425-7X500 | 8X425-7X500 | 8X425-7X500 | 8X425-7X500 |

**04. ගණකාධිකාරී තනතුර සඳහා අධ්‍යාපන සුදුසුකම් :**

i. පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් වාණිජවේදී හෝ ව්‍යාපාර කළමනාකරණ උපාධිය (පිළිගත් ආයතනයක ගණකාධිකාරී හෝ පොත් තබන්නා තනතුරක වසර 02 ක පළපුරුද්ද විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ) හෝ

ii. ශ්‍රී ලංකා උසස් තාක්ෂණ ආයතනයේ ගණකාධිකරණ උසස් ජාතික ඩිප්ලෝමා සහතිකය (HNDA) ලබා තිබීම. හෝ

iii. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ ගණකාධිකරණ පාඨමාලාවේ පළමු මට්ටමේ සාමාර්ථය ලබා තිබීම. හෝ

iv. ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ, පාඨමාලාව (AAT) III, අදියර (AA3) සමත් වීම.

**05. ගණකාධිකාරී තනතුරේ වැටුප් පරිමාණයන් :**

| ඒ ශ්‍රේණිය | බී ශ්‍රේණිය | සී ශ්‍රේණිය | ඩී ශ්‍රේණිය |
|---|---|---|---|
| 37850X44375 | 32850-39375 | 27850-34375 | 22850-29375 |
| 8X400-7X475 | 8X400-7X475 | 8X400-7X475 | 8X400-7X475 |

## පොදු කොන්දේසි

**01. වෙනත් සුදුසුකම් :**

i. වයස් සීමාව 2024.01.05 දිනට අවුරුදු 22-45 අතර වීම

ii. 2024.01.05 දිනට පූර්වාසන්න අවුරුදු 03ක කාලයක් උතුරු මැද පළාත තුළ ස්ථිර පදිංචිය තහවුරු වීම.

**02. අයදුම්පත් එවීම**

i. අයදුම්පත් උතුරු මැද පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවෙන් හෝ පළාත තුළ පිහිටි ඕනෑම විවිධ සේවා සමුපකාර සමිතියකින් ලබාගත හැක. එම අයදුම්පත් ලේකම්, සමුපකාර සේවක කොමිෂන් සභාව, 352, මෛත්‍රීපාල සේනානායක මාවත, අනුරාධපුර යන ලිපිනයට 2024.01.05 දින හෝ එදිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කවරයේ ඉහළ වම් කෙළවරේ, සමිතියේ නම හා තනතුර දැක්විය යුතුයි.

ii. එක් අයදුම්කරුවෙකු සමිති කිහිපයකට හෝ තනතුරු කිහිපයකට අයදුම් කරන්නේ නම් එක් එක් සමුපකාර සමිතියේ එක් එක් තනතුර සඳහා වෙන වෙනම අයදුම්පත් යොමු කළ යුතුය.

03. පුරප්පාඩු සියල්ල හෝ කිසියම් සංඛ්‍යාවක් පිරවීමේ හෝ නොපිරවීමේ අයිතිය උතුරු මැද පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව සතුවේ.

**(ටී.එම්.ජී.එන්.ජේ. මල්වැව),**
**ලේකම්,**
**සමුපකාර සේවක කොමිෂන් සභාව,**
**උතුරු මැද පළාත.**
**2023.12.11 දින අනුරාධපුරයේදී.**